# අධ්‍යාපනවේදී විශේෂ අවශ්‍යතා අධ්‍යාපන උපාධි වැඩසටහන 2016/2017

# සිසු උපදෙස් පොත


විශේෂ අවශ්‍යතා අධ්‍යාපන අධ්‍යයනාංශය

අධ්‍යාපන පීඨය

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

නාවල, නුගේගොඩ.

දුරකථන අංක - 011 2881015,

011 2881492

ෆැක්ස් - 011 2768055

ඊ මේල් - postmast@ou.ac.lk

# අධ්‍යාපනවේදී විශේෂ අවශ්‍යතා අධ්‍යාපන උපාධි වැඩසටහන හදාරන සිසු සිසුවියන්ට වදනක්

අපි ඔබව අධ්‍යාපනවේදී විශේෂ අවශ්‍යතා අධ්‍යාපන උපාධි වැඩසටහනට සාදරයෙන් පිළි ගනිමු.

දුරස්ථ ඉගෙනුම් ක්‍රමය යටතේ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය සමග අධ්‍යාපනවේදී  විශේෂ අවශ්‍යතා අධ්‍යාපන උපාධි වැඩසටහන හදාරන ඔබට, ඔබගේ කථිකාචාර්යවරුන්/ උපදේශකවරුන් මුණ ගැසීමට ලැබෙන්නේ දින පාසල් හා උපදේශන සැසි පවත්වනු ලබන අවස්ථාවල දී පමණි. එසේ ම දුරබැහැර සිටින ඔබ හා විවෘත විශ්වවිද්‍යාලය අතර දුරකථන හෝ තැපැල් මාර්ගයෙන් සම්බන්ධතා ඇති කර ගැනීමට ඇති ඉඩකඩ ද සීමිත ය. ඒ නිසා මෙම සිසු අත්පොතෙහි ඇති කරුණු **ඉතා හොඳින් කියවා** වැඩසටහන අතරතුර මතුවන විවිධ ගැටලු නිරාකරණය කිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ග පිළිබඳව ඔබ විසින් හොඳ අවබෝධයක් ඇති කරගත යුතු වේ.

විශේෂයෙන් ම මෙම උපදෙස් පොතෙහි සඳහන් වන අන්දමට දින පාසල් සඳහා සහභාගී වීම ද නියමිත දිනට පැවරුම් සම්පූර්ණ කොට භාර දීම ද ප්‍රායෝගික ඉගැන්වීම් කටයුතු නිම කරවා ගැනීම ද සම්පූර්ණයෙන් ම ඔබගේ වගකීමක් වෙයි. මෙම අත්පොතට අමතරව වෙනත් දැන්වීමක් ඔබ වෙත විවෘත විශ්වවිද්‍යාලය මඟින් කෙරෙන්නේ අදාළ කාල සටහන්වල වෙනසක් ඇති වුවහොත් පමණක් බවද මතක තබා ගන්න.

අධ්‍යාපනවේදී  විශේෂ අවශ්‍යතා අධ්‍යාපන උපාධි වැඩසටහනේ සියලු සාර්ථකත්වයන් ළඟා වේවා යි ඉත සිතින් පතමු.

# අන්තර්ගතය


| | | පිටුව |
|---|---|---|
| **1.0.** | **අධ්‍යාපන පීඨය** | **01** |
| | **අධ්‍යාපනවේදී විශේෂ අවශ්‍යතා අධ්‍යාපන උපාධි වැඩසටහන** | |
| 2.0 | වැඩසටහනෙහි අරමුණ | 02 |
| 2.1 | වැඩසටහනේ කාලසීමාව | 02 |
| 2.2 | ඉගැන්වීමේ මාධ්‍යය | 02 |
| 2.3 | මධ්‍යස්ථානය | 03 |
| **3.0** | **ඇතුළත්වීම සඳහා සුදුසුකම්** | **03** |
| **4.0** | **සම්මාන පැවරීම සහ නිදහස් කිරීම** | **03** |
| 4.1 | සම්මාන පැවරීම | 03 |
| 4.2 | නිදහස් කිරීම | 03 |
| **5.0** | **වැඩසටහන් අන්තර්ගතය** | **05** |
| 5.1 | අධ්‍යයන වැඩසටහනෙහි පාඨමාලා ව්‍යුහය | 05 |
| 5.2 | අධ්‍යයන ක්‍රමය | 07 |
| 5.3 | දින පාසල් | 07 |
| 5.4 | ශිෂ්‍ය උපදේශන කාර්ය සැසි | 08 |
| 5.5 | ශ්‍රව්‍ය - දෘශ්‍ය ඉගෙනුම් ද්‍රව්‍ය | 09 |
| **6.0** | **ඇගැයීම** | **10** |
| 6.1 | ඇගැයීමේ කොටස් | 10 |
| 6.2 | අඛණ්ඩ ඇගැයීම සඳහා පැවරුම් | 10 |
| 6.3 | අවසාන ලකුණු තීරණය කිරීම. | 11 |
| 6.4 | අවසාන පරීක්ෂණයට සුදුසුකම් (යෝග්‍යතාව) නොලැබීම | 14 |
| 6.5 | ලිඛිත පරීක්ෂණය | 20 |
| 6.6 | ප්‍රායෝගික ඉගැන්වීම | 20 |

7.0 සහතික ප්‍රදානය 29

8.0 පස්වන මට්ටම සඳහා ගාස්තු 30

9.0 වැඩසටහනට අදාළ විමසීම් 31

10.0 අධ්‍යයන වැඩසටහන/පාඨමාලා කල් දැමීම 32

10.1 ලියාපදිංචි වු අධ්‍යයන වැඩසටහනින් ඉවත් වීම 33

11.0 ලිපිනයන් වෙනස් වීම 33

12.0 අධ්‍යයන වැඩසටහනෙහි ආරම්භය 33

13.0 වැඩසටහන හා සම්බන්ධව කටයුතු කරන අධ්‍යයන කාර්ය මණ්ඩලය 34

14.0 MY OUSL 37

15.0 අයදුම්පත් සහ ලියාපදිංචිය 37

ඇමුණුම 1- ONLINE අයදුම්පත් පිරවීම සඳහා උපදෙස් 39

ඇමුණුම 2- ප්‍රාදේශිය මධ්‍යස්ථාන 43

# 1.0 අධ්‍යාපන පීඨය

අධ්‍යාපන පීඨය අධ්‍යයනාංශ තුනකින් සමන්විතය.

1. ද්විතීයික හා තෘතියික අධ්‍යාපන අධ්‍යයනාංශය
2. මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපන අධ්‍යයනාංශය
3. විශේෂ අවශ්‍යතා අධ්‍යාපන අධ්‍යයනාංශය

විශේෂ අවශ්‍යතා අධ්‍යාපන අධ්‍යයනාංශය මගින් දැනට අධ්‍යයන වැඩසටහන් දෙකක් සහ කෙටි කාලීන පාඨමාලා දෙකක් ඉදිරිපත් කෙරේ.

1. පශ්චාත් උපාධි විශේෂ අවශ්‍යතා අධ්‍යාපන ඩිප්ලෝමා වැඩසටහන
2. අධ්‍යාපනවේදී විශේෂ අවශ්‍යතා අධ්‍යාපන උපාධි වැඩසහන
3. ඉගෙනුම් දුබලතා සහිත ළමයින්ට ඉගැන්වීම පිළිබඳ කෙටි කාලීන පාඨමාලාව
4. අන්තර්කරණ අධ්‍යාපනය පිළිබඳ කෙටි කාලීන පාඨමාලාව

# අධ්‍යාපනවේදී විශේෂ අවශ්‍යතා අධ්‍යාපන උපාධි වැඩසටහන

## 2.0 වැඩසටහනෙහි අරමුණ

විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය අන්තර්කරණ අධ්‍යාපනය සහ ඉගැන්වීමේ කලාව සේම දැනුම සහ කුසලතා සම්බන්ධව ඇති සියළුම අංශයන් පිළිබඳව අවබෝධයක් සහිතව කටයුතු කිරීම සඳහා පූර්ව සේවා ගුරුවරුන් සූදානම් කිරීම මෙම වැඩසටහනෙහි මූලික අරමුණ වේ.

## 2.1 වැඩසටහනේ කාලසීමාව

මෙය අවුරුදු හතරක වැඩසටහනකි. (එහෙත් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ඩිප්ලෝමා මට්ටමේ සුදුසුකමක් සම්පූර්ණ කළ සිසුන්ට හැදෑරීමට ඇත්තේ වැඩසටහනේ අවසාන අවුරුදු දෙක පමණි)

## 2.2 ඉගැන්වීමේ මාධ්‍යය

වැඩසටහන සිංහල ඉංග්‍රීසි හා දෙමළ මාධ්‍යවලින් පවත්වනු ලැබේ.

(කෙසේවෙතත් ඒ ඒ මාධ්‍යයන්ට ලියාපදිංචි වන ශිෂ්‍ය සංඛ්‍යාව මත වැඩසටහන පිරිනමන ඉගෙනුම් මාධ්‍යයය තීරණය වේ.)

## 2.3 මධ්‍යස්ථානය

**මෙම වැඩසටහන කොළඹ ප්‍රාදේශිය මධ්‍යස්ථානයේ දි පමණක් පවත්වනු ලැබේ.**

## 3.0 ඇතුළත්වීම සඳහා සුදුසුකම්

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය මගින් මෙහෙයවනු ලබන ඕනෑම ඩිප්ලෝමා මට්ටමේ පාඨමාලාවක් (3 වන සහ 4 වන මට්ටම) සම්මාන 72 (ප්‍රධාන/අනිවාර්ය විෂයන්ගෙන් සැදුම් ලත්) සහිතව සමත්ව තිබීම

## 4.0 සම්මාන පැවරීම (Credit Transfer) සහ (Exemptions) නිදහස් කිරීම

## 4.1 සම්මාන පැවරීම

යම් සිසුවෙක් සම්මාන 72 ක් සහිතව අධ්‍යයන වර්ෂ පහක් ඇතුළත තුන්වන සහ හතරවන මට්ටම් සම්පූර්ණ කර ඇත්නම් ඔහුට/ඇයට සම්මාන 72 පූර්ණ සම්මාන පැවරීමක් කිරීමට හැකියාව ඇත.

## 4.2 නිදහස් කිරීම

යම් සිසුවෙක් සම්මාන 72 ක් සහිතව අධ්‍යයන වර්ෂ පහකට පසුව තුන්වන සහ හතරවන මට්ටම් සම්පූර්ණ කර ඇත්නම් ඔහු/ඇය සම්මාන 72 දක්වා පාඨමාලා වලින් නිදහස් කිරීමට හැකියාව ඇත.

## 5.0 වැඩසටහන් අන්තර්ගතය

මෙම වැඩසටහනට අනිවාර්ය පාඨමාලා ඇතුළත් වේ. පාඨමාලා සඳහා අදාළ මොඩියුල කොළඹ ප්‍රාදේශිය මධ්‍යස්ථානයෙන් ලබා ගත හැකි ය. ඒ සඳහා ඔබගේ ශිෂ්‍ය වාර්තා පොත ඉදිරිපත් කළ යුතු ය.

## 5.1 අධ්‍යයන වැඩසටහනෙහි පාඨමාලා ව්‍යුහය 5 වන මට්ටම

| | | |
|---|---|---|
| 1. | ESU3235 | විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ මනෝ විද්‍යාව |
| 2. | ESU3136 | විශේෂ අවශ්‍යතා අධ්‍යාපනයේ දාර්ශනික පදනම |
| 3. | ESU3137 | විශේෂ අවශ්‍යතා අධ්‍යාපනයේ සමාජ විද්‍යාත්මක පදනම |
| 4. | ESU3138 | විශේෂ තත්ත්වයන් සහ ඉගෙනුම් අවශ්‍යතා පිළිබඳ හැඳින්වීම |
| 5. | ESU3139 | අධ්‍යාපනයේ නව ප්‍රවණතා |
| 6. | ESU3240 | තුලනාත්මක අධ්‍යාපනය සහ අධ්‍යාපනික ගැටළු |
| 7. | ESU3141 | අධ්‍යාපනික මාර්ගෝපදේශනය හා උපදේශනය |
| 8. | ESU3142 | අන්තර්කරණ අධ්‍යාපනය |
| 9. | ESU3143 | විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය තුළ මිනුම් සහ ඇගයුම |
| 10. | ESU3144 | විෂයමාලා න්‍යාය හා පරිචය |

**අඛණ්ඩ අධ්‍යයන පාඨමාලා**

| | | |
|---|---|---|
| 11 | ESE5246 | විශේෂ අවශ්‍යතා සහිත ළමයින් සඳහා මනා පන්තිකාමර පරිසරයක් නිර්මාණය කිරීම |
| 12 | ESE5147 | අන්තර්කරණ පන්තිකාමර වල ළමයින්ගේ ගැටළු සමග කටයුතු කිරීම |

**6 වන මට්ටම**

| | | |
|---|---|---|
| 1. | ESU4220 | විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය සඳහා අධ්‍යාපන තාක්‍ෂණය |
| 2. | ESU4121 | ප්‍රාථමික අධ්‍යාපනය |
| 3. | ESU4326 | ප්‍රායෝගික ඉගැන්වීම |
| 4. | ESU4322 | ව්‍යාපෘතිය |
| 5. | ESU4123 | ළමා අයිතිවාසිකම් |
| 6. | ESU4124 | අධ්‍යාපනික කළමාණාකරණය |
| 7. | ESU4125 | පුනරුත්ථාපනය හා ප්‍රජා මූලික පුනරුත්ථාපනය |

**අඛණ්ඩ අධ්‍යයන පාඨමාලා**

| | | |
|---|---|---|
| 8 | ESE6246 | අන්තර්කරණ පන්තිකාමර වල ළමයින් සඳහා විෂයමාලා සංවර්ධනය සහ අනුවර්තනය |
| 9 | ESE6147 | විශේෂ අවශ්‍යතා අධ්‍යාපනයට බහුවිෂයික ප්‍රවේශ |

අධ්‍යාපන තාක්ෂණය පාඨමාලාව (ESU4220) යටතේ හඳාරනු ලබන විශේෂ ඉගැන්වීම් ක්‍රම සඳහා පහත සඳහන් විෂයයන් අතරින් එක් විෂයයක් තෝරා ගැනීමට ශිෂ්‍යයාට හැකි ය.

1 සිංහල භාෂාව/ දෙමළ භාෂාව / ඉංග්‍රීසි භාෂාව

2 විද්‍යාව

3 ගණිතය

4 ප්‍රාථමික පාසලේ සමෝධානික විෂයයන්

ප්‍රායෝගික ඉගැන්වීම සඳහා ද විශේෂ ඉගැන්වීම් ක්‍රම සඳහා ඉහත ක්ෂෙත්‍ර වලින් එකක් තෝරා ගැනීම වඩාත් සුදුසු වේ.

කෙසේ වෙතත් මීට අතිරේකව සියළුම සිසුන් විසින් **පහත ක්ෂෙත්‍ර සියල්ලම** අනිවාර්යෙන් අධ්‍යයනය කළ යුතු අතර ඊට අදාළ අතිරේක පාඩම් සෑම සිසුවෙකුටම ඉදිරියේදී සපයනු ඇත

1. දෘෂ්ටි ඌනතා සහිත ළමයින්ට ඉගැන්වීම
2. ශ්‍රවණ ඌනතා සහිත ළමයින්ට ඉගැන්වීම
3. බුද්ධිමය දුබලතා සහිත ළමයින්ට ඉගැන්වීම
4. ඉගෙනුම් දුබලතා සහිත ළමයින්ට ඉගැන්වීම

## 5.2 අධ්‍යයන ක්‍රමය

ඉගැන්වීමේ ප්‍රධාන ක්‍රමය, දුරස්ථ අධ්‍යාපන මාධ්‍යය වේ. නියමිත පාඨමාලා සඳහා පිළියෙල කරන ලද පාඨග්‍රන්ථවලට අදාළ ක්‍රියාකාරකම්, අභ්‍යාස හා ශිෂ්‍යෝපදේශන සැපයෙනු ඇත. නිර්දිෂ්ඨ කියවීම් ලේඛනයක් ද එයට ඇතුළත් වේ. ස්වයං අධ්‍යයනය ශිෂ්‍යයන්ගෙන් අනිවාර්යයෙන් ම අපේක්ෂා කෙරේ. පාඨග්‍රන්ථවල අන්තර්ගත ක්‍රියාකාරකම් සහ අභ්‍යාස ප්‍රශ්න සම්පූර්ණ කිරීමත්, පාඩම් ඒකකවලට අදාළ අමතර කියවීමෙහි යෙදීමත්, ශිෂ්‍යයන්ගේ වගකීම වෙයි. මේවා කලින් කල පැවැත්වෙන සාකච්ඡා, සම්මන්ත්‍රණ සහ කාර්ය සැසි මඟින් පරිපූර්ණ කෙරෙනු ඇත.

## 5.3 *දින පාසල්*

දින පාසල් පැවැත්වීමේ අරමුණ වන්නේ දුරස්ථ අධ්‍යාපන මාධ්‍යය තුළින් මතුවන ගැටලු නිරාකරණය කර ගැනීමට හා එම පාඩම් ඒකකවලට අයත් කරුණු සම්බන්ධව වැඩිදුර දැනුමක් ලබා ගැනීමට අවස්ථාවක් සලසා දීමයි. මෙම දින පාසල්, සතියේ දින හෝ සති අන්තවල දී පැවැත්වෙනු ඇත. දින පාසල්වලට පැමිණීම ඔබගේ පාඨග්‍රන්ථ හැදෑරීමට උදව්වක් වන අතර, එහිදී ඔබගේ අධ්‍යයන ගැටලු ආචාර්ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට ද අවස්ථාවක් සැලසේ.

වැඩසටහන පිළිබඳ තොරතුරු කලින් කල ඔබ වෙත දැන්වීම සඳහා ද, දින පාසල් උපයෝගී කර ගැනීමට ඉඩ ඇති බව සලකන්න.

සියලුම දින පාසල් අන්තර් ක්‍රියාකාරී සැසි ලෙස සංවිධානය කර ඇති අතර, එමඟින් විවිධ ක්‍රියාකාරකම් සමඟ සිසුන්ට ඉගෙනීමට අවස්ථාව සැපයේ. එම නිසා සිසුන්ට ක්‍රියාකාරීව සහභාගී වීමට සහ ඔවුන්ගේ අත්දැකීම් බෙදා හදා ගැනීමට ද මෙම දිනපාසල් කාලය තුළ දී හැකියාව ලැබේ.

## 5.4 *ශිෂ්‍ය උපදේශන කාර්ය සැසි*

මෙම වැඩසටහන සඳහා මුද්‍රිත ද්‍රව්‍ය, උපකාරක දින පාසල් යනාදියට අතිරේකව, ශිෂ්‍ය උපදේශන සැසි ද පැවැත්වේ. එහි දී මුද්‍රිත ඉගෙනුම් ද්‍රව්‍ය පිළිබඳව ඇති ගැටලු සාකච්ඡා කිරීම හා වැඩසටහන පිළිබඳව ශිෂ්‍යයන්ට අවශ්‍ය උපදේශනය සැපයීම ද සිදු කෙරෙනු ඇත.

ESU3235 පාඨමාලාව සඳහා පැය පහක උපදේශන සැසියක් ද ESU3240 සඳහා පැය හතරක උපදේශන සැසියක්ද පවත්වනු ලැබේ. ඉතිරි පාඨමාලා සඳහා පැය තුන බැගින් වන උපදේශන සැසි පවත්වනු ලැබේ.

මෙම සැසි මෙහෙය වන උපදේශන ආචාර්යවරයා හෝ වරිය, ඒවා පවත්වන දිනය තීරණය කර ශිෂ්‍යයන්ට දන්වනු ඇත.

**ශිෂ්‍ය උපදේශන සැසිවලදී උපරිම සාර්ථකත්වය අත්පත් කර ගැනීමට, ඔබගේ සහභාගිත්වය හා කථිකාචාර්යවරයා විසින් ඔබෙන් අපේක්ෂා කරන පෙර සූදානමත් අත්‍යවශ්‍ය වේ.**

### 5.5 *ශ්‍රව්‍ය - දෘශ්‍ය ඉගෙනුම් ද්‍රව්‍ය*

ඉහත දැක්වූ ක්‍රමවලට අමතරව විශේෂ අවශ්‍යතා අධ්‍යාපන අධ්‍යයනාංශයට අදාල ශ්‍රව්‍ය දෘශ්‍ය පට හා CD ගණනාවක් ද ඇත. මොඩියුලවල ඇති දුරවබෝධ තැන් පැහැදලි කර ගැනීමට මේවා ඔබට ආධාර වනු ඇත. විවෘත විශ්වවිද්‍යාලයීය පුස්තකාලයේ ඇති ශ්‍රව්‍ය දෘශ්‍ය සම්පත් මධ්‍යස්ථානයේදී ඔබට කණ්ඩායම් වශයෙන් හෝ තනිව පැමිණ මේවා ශ්‍රවණය කිරීම හා නැරඹීමට හැකි ය. එසේම දින පාසල්වල දී ද ඉඩ ලැබෙන පරිදි දෘශ්‍ය පට ප්‍රදර්ශනය කිරීමට ද බලාපොරොත්තු වේ.

## 6.0 ඇගැයීම

### 6.1 *ඇගැයීමට අදාළ ප්‍රධාන කොටස්*

අ. පැවරුම් මගින් කෙරෙන අඛණ්ඩ ඇගැයීම.

ආ. අධ්‍යයන වර්ෂය අවසානයේ දී ලිඛිත පරීක්ෂණ මඟින් කෙරෙන ඇගැයීම.

ඇ. ප්‍රායෝගික ඉගැන්වීම පිළිබඳව කෙරෙන ඇගැයීම.

### 6.2 *අඛණ්ඩ ඇගැයීම සඳහා පැවරුම්*

එක් එක් පාඨමාලාව සඳහා සම්පූර්ණ කළ යුතු පැවරුම් සංඛ්‍යාව වගු අංක 1හි දක්වා ඇත. සියලුම පැවරුම් සම්පූර්ණ කිරීම අනිවාර්යය වේ.

ඒ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු ඔබේ සැළකිල්ලට යොමු කරවමි.

පැවරුම් සාර්ථකව නිම කිරීම සහ අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට යෝග්‍යතාව ලබා ගැනීම සඳහා පැවරුම් 3ක් සහිත පාඨමාලාවලින් අඩුම වශයෙන් ඉන් දෙකකටවත් “C” ශ්‍රේණි ලබා ගත යුතුවන අතර පැවරුම් 2ක් සහිත පාඨමාලා සඳහා අඩු වශයෙන් ඉන් එකකටවත් “C” ශ්‍රේණියක් ලබා ගත යුතුය.

- සියලුම පැවරුම් සහ උපදෙස් වැඩසටහන ආරම්භයේ දී දෙනු ලැබේ.

## 6.3 *අවසාන ලකුණු තීරණය කිරීම.*

එක් එක් පාඨමාලාවට අදාළ පැවරුම් ලකුණු, අවසාන පරීක්ෂණ ලකුණුවලට එකතු වීමට නම් ඔබ අනිවාර්යයෙන්ම අවසාන පරීක්ෂණයේ දී එක් එක් පාඨමාලාවට ලකුණු 40 ක් හෝ ඊට ඉහළ ලකුණක් ලබා ගත යුතුය. එසේ නොතිබුණහොත් අවසාන පරීක්ෂණ ලකුණු පමණක් ඔබගේ ප්‍රතිඵල තීරණය කිරීම සඳහා සළකා බලනු ඇත.

එක් එක් පාඨමාලාවේ අවසාන ලකුණ තීරණය කෙරෙන්නේ එම පාඨමාලාවට අදාළ පැවරුම්වලින් වැඩිම ලකුණු ලබා ගන්නා පැවරුම/ පැවරුම්වල සාමාන්‍යයෙන් 30% ක් ද, ලිඛිත පරීක්ෂණයට ලබා ගත් ලකුණු 70% ක් ද සළකා බැලීමෙනි.

**පැවරුම් ලකුණු (X) සහ ලිඛිත පරීක්ෂණ ලකුණ (Y) අනුව අවසාන ලකුණ (Z) තීරණය කරන ආකාරය පහත සමීකරණයෙන් දැක්වේ.**

$$Z = X \times 30\% + Y \times 70\%$$

## වගුව 1 - එක් එක් පාඨමාලාව සඳහා අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට සුදුසුකම් (යෝග්‍යතාව) ලබා ගැනීම

| පාඨමාලාව | | භාරදිය යුතු පැවරුම් ගණන | යෝග්‍යතාවය සඳහා සැලකිල්ලට ගනු ලබන පැවරුම් ගණන | අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට සුදුසුකම් (යෝග්‍යතාව) ලැබීම |
|---|---|---|---|---|
| ESU3235 | විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ මනෝ විද්‍යාව | 3 | 2 | පැවරුම් දෙකකට අවම වශයෙන් 40% බැගින් ලකුණු ලබාගත යුතුය. |
| ESU3136 | විශේෂ අවශ්‍යතා අධ්‍යාපනයේ දාර්ශනික පදනම | 2 | 1 | එක් පැවරුමක් සඳහා අවම වශයෙන් 40% ලකුණු ලබාගත යුතුය. |
| ESU3137 | විශේෂ අවශ්‍යතා අධ්‍යාපනයේ සමාජ විද්‍යාත්මක පදනම | 2 | 1 | එම |
| ESU3138 | විශේෂ තත්ත්වයන් සහ ඉගෙනුම් අවශ්‍යතා පිළිබඳ හැඳින්වීම | 2 | 1 | එම |
| ESU3139 | අධ්‍යාපනයේ නව ප්‍රවණතා | 2 | 1 | එම |
| ESU3240 | තුලනාත්මක අධ්‍යාපනය සහ අධ්‍යාපනික ගැටළු | 3 | 2 | පැවරුම් දෙකකට අවම වශයෙන් 40% බැගින් ලකුණු ලබාගත යුතුය. |
| ESU3141 | අධ්‍යාපනික මාර්ගෝපදේශනය හා උපදේශනය | 2 | 1 | එක් පැවරුමක් සඳහා අවම වශයෙන් 40% ලකුණු ලබාගත යුතුය. |
| ESU3142 | අන්තර්කරණ අධ්‍යාපනය | 2 | 1 | එම |
| ESU3143 | විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය තුළ මිනුම් සහ ඇගයුම | 2 | 1 | එම |
| ESU3144 | විෂයමාලා න්‍යාය හා පරිචය | 2 | 1 | එම |
| ESE5246 | විශේෂ අවශ්‍යතා සහිත ළමයින් සඳහා මනා පන්තිකාමර පරිසරයක් නිර්මාණය කිරීම | 2 | 1 | එම |

| | | | | |
|---|---|---|---|---|
| ESE5147 | අන්තර්කරණ පන්තිකාමර වල ළමයින්ගේ ගැටළු සමග කටයුතු කිරීම | 2 | 1 | එම |
| ESU4220 | විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය සඳහා අධ්‍යාපන තාක්‍ෂණය | 3 | 2 | පැවරුම් දෙකකට අවම වශයෙන් 40% බැගින් ලකුණු ලබාගත යුතුය. |
| ESU4121 | ප්‍රාථමික අධ්‍යාපනය | 2 | 1 | එක් පැවරුමක් සඳහා අවම වශයෙන් 40% ලකුණු ලබාගත යුතුය. |
| ESU4123 | ළමා අයිතිවාසිකම් | 2 | 1 | එම |
| ESU4124 | අධ්‍යාපනික කළමාණාකරණය | 2 | 1 | එම |
| ESU4125 | පුනරුත්ථාපනය හා ප්‍රජා මුලික පුනරුත්ථාපනය | 2 | 1 | එම |
| ESE6246 | අන්තර්කරණ පන්තිකාමරවල ළමයින් සඳහා විෂයමාලා සංවර්ධනය සහ අනුවර්තනය | 2 | 1 | එම |
| ESE 6147 | විශේෂ අවශ්‍යතා අධ්‍යාපනයට බහුවිෂයික ප්‍රවේශය | 2 | 1 | එම |
| ESU4326 | ප්‍රායෝගික ඉගැන්වීම | පළමු අදියර-සති 10ක් තුළ පාඩම් පහක් අහඹු ලෙස අධීක්ෂණය | | පළමු අදියරයෙන් අවම වශයෙන් 40% ලකුණු ලබාගත යුතුය. |

## 6.4 ***අවසාන පරීක්ෂණයට සුදුසුකම් (යෝග්‍යතාව) නොලැබීම:-***

(i). යම් පාඨමාලාවකට අදාළ පැවරුම් සඳහා අවම වශයෙන් 'C' ශ්‍රේණියක් ලබා නොගන්නා සිසුන් ද, (වගුව 1 බලන්න.)

(ii). යම් පාඨමාලාවකට අදාළ පැවරුම්වලට පිළිතුරු ලියා නියමිත දිනට ඉදිරිපත් නොකරන සිසුන් ද,

**එම පාඨමාලාවේ අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට සුදුසුකම් (යෝග්‍යතාව) නොලබනු ඇත.**

**සැ.යු.** පැවරුම් ලකුණු අනුව ඔබ කිසියම් පාඨමාලාවකට ලබා ගන්නා යෝග්‍යතාව අධ්‍යයන වර්ෂ 3ක් සඳහා පමණක් වලංගු වේ.

6.4.1 (වගුව 1 හි සඳහන් කරුණු ඔබේ සැලකිල්ලට යොමු කරවමි.) නිම කළ පැවරුම් කොළඹ ප්‍රාදේශීය මධ්‍යස්ථානයට භාර දිය යුතු අවසාන දිනය ඔබට පසුව සපයනු ලබන කාලසටහනෙහි දැක්වෙනු ඇත. ලියාපදිංචියේදී නියමිත දින හෝ ඊට පෙර පැවරුම් නිම කොට කොළඹ ප්‍රාදේශීය අධ්‍යයන මධ්‍යස්ථානයට පමණක් භාර දිය යුතු වේ. ඒ පිළිබඳ ගැටලුවක් ඇතොත් උපදේශකවරයාගෙන් විමසා එය නිසැකව දැන ගත යුතු ය. කොළඹ

මධ්‍යස්ථානයේ පැවරුම් භාර ගැනීම සිදු කරන්නේ අධ්‍යාපන පීඨයේදී ය.

ඔබ විසින් නිම කරනු ලබන කිසිදු පැවරුමක් විශේෂ අවශ්‍යතා අධ්‍යාපන අධ්‍යයනාංශය වෙත ගෙනවුත් භාර දීම හෝ තැපැල් කර එවීම හෝ නොකළ යුතුය. තැපැල් කර එවනු ලබන පැවරුම් භාර ගනු නොලැබේ.

නියමිත දිනට පසුව කොළඹ ප්‍රාදේශීය මධ්‍යස්ථානය විසින් පැවරුම් භාර නොගනු ඇත. විශේෂ අවශ්‍යතා අධ්‍යාපන අධ්‍යයනාංශය ලකුණු කිරීම සඳහා භාර ගනු ලබන්නේ කොළඹ ප්‍රාදේශීය මධ්‍යස්ථානය මඟින් ලේඛන ගත කොට එවනු ලබන පැවරුම් පමණක් බව කරුණාවෙන් සළකන්න.

6.4.2 ඔබ විසින් කොළඹ ප්‍රාදේශීය මධ්‍යස්ථානයට පැවරුම් භාර දිය යුතු වන්නේ ඔබට ලැබෙන දවටන (Folders) සමඟ ය. එසේ භාරදුන් පසු භාර දුන් බවට රිසිට් පතක් ලබා ගැනීමට අමතක නොකරන්න.

6.4.3 ඒ ඒ පැවරුමට අදාළ දවටන ඔබ ලියාපදිංචි වන අවස්ථාවේ දී ලැබෙනු ඇත. යම් හෙයකින් එදින

පැවරුම් එවීම සඳහා ඔබට දවටන නොලැබුනහොත් විශේෂ අවශ්‍යතා අධ්‍යාපන අධ්‍යයනාංශයට පැමිණ එම දවටන ලබා ගන්න. ලකුණු කරන ලද පැවරුම් ඔබ වෙත ආපසු එවීමට කොළඹ ප්‍රාදේශීය මධ්‍යස්ථාන සමඟ විශේෂ අවශ්‍යතා අධ්‍යාපන අධ්‍යයනාංශය කටයුතු සලස්වනු ඇත

6.4.4 පැවරුම් පිළිබඳව යම් ගැටලුවක් ඇත්නම් විශේෂ අවශ්‍යතා අධ්‍යාපන අධ්‍යයනාංශයෙන් ඒ පිළිබඳව නොපමාව විමසන්න. යම් හෙයකින් ඔබට පැවරුමක් ලැබී නැත්නම් එය කොළඹ ප්‍රාදේශීය මධ්‍යස්ථානයෙන් හෝ නාවල අධ්‍යාපන පීඨයේ, විශේෂ අවශ්‍යතා අධ්‍යාපන අධ්‍යයනාංශයෙන් හෝ ලබා ගැනීම ඔබේ වගකීම බව කරුණාවෙන් සළකන්න.

6.4.5 පැවරුම් සඳහා ලබන ලකුණු අඛණ්ඩ ඇගැයීමේ කොටසක් බැවින් එක් එක් පැවරුම ලකුණු කර අවසාන වූ වහාම අවශ්‍ය කටයුතු සඳහා දත්ත සැකසුම් අංශයට භාර දෙනු ලැබේ. ඒ නිසා ලකුණු කරන ලද පැවරුම් පිළිබඳව ඔබ විසින් ඉදිරිපත් කරන අභියාචනා සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට අධ්‍යාපන අධ්‍යයනාංශයට නොහැකි බව ද සළකන්න.

6.4.6 ඔබේ පැවරුම්වල මුල් පිටුවේ පහත සඳහන් කරුණු ඇතුළත් කරන්න.

1 නම:-

2 ලියාපදිංචි අංකය:-

(සෑම පිටුවකම ලියාපදිංචි අංකය සඳහන් කරන්න.)

3 මධ්‍යස්ථානය:-

4 ලිපිනය

5 පාඨමාලා කේතාංකය හා පැවරුම් අංකය

*(නිද:- ESU2230/ 2 වැනි පැවරුම)*

6.4.7 ඔබ ඉදිරිපත් කරන පැවරුම් පැහැදිලි අත් අකුරින් ලියා හෝ යතුරු ලියනය කර ඉදිරිපත් කරන්න.

6.4.8 පරීක්ෂකවරයාට පැවරුම් සම්බන්ධව ගුණදොස් ලියා දැක්වීම සඳහා කොළයේ වම් කෙළවරේ අඟල් 1.4ක් පමණ තීරයක් ඉතුරු කරන්න.

6.4.9 එක් පැවරුමකට අයත් සියලුම ප්‍රශ්නවලට එකවර පිළිතුරු ලියා ඉදිරිපත් කළ යුතු ය. ඒවා කොටස් කිහිපයකට වෙන් කොට පිළිතුරු ඉදිරිපත් කිරීමෙන් වළකින්න.

6.4.10 පැවරුම්වල පිටු නිවැරදිව අමුණා තිබේ දැයි භාර දීමට පෙර පරීක්‍ෂා කර බලන්න. එසේම පැවරුම්වල ඒ ඒ ප්‍රශ්නවලට පිළිතුරු අනු පිළිවෙලින් අමුණා තිබේ දැයි බලන්න. පැවරුම්වලට අමුණා වෙනත් ලිපි එවීමෙන් වළකින්න. පැවරුම් පිළිබඳ තවත් විස්තර සහ උපදෙස් සඳහා පැවරුම් පොත බලන්න. පැවරුම් ඉදිරිපත් කිරීමේ දී එම උපදෙස් ද පිළිපැදිය යුතු වේ.

**වැදගත්**

පැවරුම් නියමිත දිනට සම්පූර්ණ කොට <u>කොළඹ ප්‍රාදේශීය මධ්‍යස්ථානයට පමණක්</u> භාර දෙන්න. ඔබට සපයා ඇති උපදෙස් අනුව පැවරුම් සම්පූර්ණ නොකළහොත් අදාළ පාඨමාලාවන්ගෙන් විභාගයට පෙනී සිටීම සඳහා යෝග්‍යතාව නොලැබෙනු ඇත. එසේ යෝග්‍යතාව නොලැබෙන පාඨමාලා සම්පූර්ණ කිරීමට ඔබට සිදුවන්නේ ඊට පසු වසරක දීය.

මෙසේ යෝග්‍යතාව නොලබන පාඨමාලා සඳහා ඊළඟ වසරේ දී දෙගුණයක් උපදේශනය ගාස්තු ගෙවීමට සිදුවන බව ද මතක තබා ගන්න.

6.4.11 පැවරුම් සඳහා ශ්‍රේණි ලබා දෙන අන්දම පහත දැක්වේ.

| ලකුණු පරාසයන් | ශ්‍රේණිය |
|---|---|
| 85 - 100 | A+ |
| 70 - 84 | A |
| 65 - 69 | A- |
| 60 -  64 | B+ |
| 55 - 59 | B |
| 50 - 54 | B- |
| 45 - 49 | C+ |
| **40 - 44** | **C** |
| 35 - 39 | C - |
| 30 - 34 | D+ |
| 20 - 29 | D |
| 00 - 19 | E |

← යෝග්‍යතා මට්ටම

6.4.12 පැවරුම් ඇගයීම් ක්‍රියාවලියේ අනිවාර්ය කොටසකි. එය සිසුන්ගේ ස්ව නිර්මාණයක් විය යුතුය. යම් හෙයකින් පැවරුම් ලිවීමේ දී වංචනික ක්‍රියාවක් සිදු වූ බව සනාථ වුවහොත් එම ශිෂ්‍යයාට ‘E’ සාමාර්ථයක් හිමි වේ.

## 6.5 *ලිඛිත පරීක්ෂණය*

6.5.1 අධ්‍යයන වර්ෂය අවසානයේ දී ලිඛිත පරීක්ෂණයට ද පෙනී සිටිය යුතු වේ.

එක් එක් පාඨමාලාව සඳහා පැය තුන බැගින් වූ ප්‍රශ්න පත්‍ර සකසනු ලැබේ. මෙම ප්‍රශ්න පත්‍ර අනිවාර්ය වේ.

ESU4322 සහ ESU4326 සඳහා ලිඛිත පරීක්ෂණ නැත.

කිසිම හේතුවක් නිසා හෝ මෙම වැඩසටහනේ පිළිතුරු පත්‍ර නැවත සමීක්ෂණය කළ නොහැකි බව සලකන්න.

## 6.6 *ප්‍රායෝගික ඉගැන්වීම*

මෙය අදියර දෙකකින් යුක්ත වේ.

i. විශේෂ අවශ්‍යතා අධ්‍යාපන අධ්‍යයනාංශය නම් කරන පාසලක ප්‍රමුඛාචාර්යවරයෙකු විසින් සිදු කරනු ලබන අධීක්ෂණය සහ ඇගයීම

ii. විශේෂ අවශ්‍යතා අධ්‍යාපන අධ්‍යයනාංශය නම් කරන විශේෂ ඒකකයක/විශේෂ පාසලක විශ්ව විද්‍යාල කථිකාචාර්යවරයකු විසින් සිදු කරනු ලබන අධීක්ෂණය සහ ඇගයීම

### 6.6.1 කාල සීමාව-

**ප්‍රායෝගික ඉගැන්වීමේ පළමු අදියර:**

මෙය කොටස් දෙකකින් යුක්ත ය.

i. පළමු සති අට(8) තුළ (සතියකට කාලච්ඡේද9-12 අතර) විශේෂ අවශ්‍යතා අධ්‍යාපන අධ්‍යයනාංශය නම් කරන පාසලක ප්‍රමුඛාචාර්යවරයෙකුගේ අධීක්ෂණය යටතේ ඉගැන්විය යුතුය.

ii. අවසාන සති දෙක (2) තුළ විශේෂ පාසලක් හෝ ඒකකයක දී පළමු වන අදියරේ ඉගැන්වීම සම්පූර්ණ කළ යුතු වේ.

සමස්තයක ලෙස ප්‍රමුඛාචාර්යවරයා පාඩම් පහක් අධීක්ෂණය කරයි.

ප්‍රායෝගික ඉගැන්වීමට අදාළ සති 10 තුළ අදාළ පාසලේ රැඳී සිටීම අනිවාර්ය වේ.

### ප්‍රායෝගික ඉගැන්වීමේ දෙවන අදියර

ප්‍රායෝගික පුහුණුව 2 අදියර විශ්ව විද්‍යාල කථිකාචාර්යවරයකු විසින් අධීක්ෂණය කරනු ලබන අතර එම විදුහල හෝ ඒකකය ඔබට දන්වා එවනු ඇත.

ප්‍රායෝගික ඉගැන්වීම සඳහා ප්‍රදානය කෙරෙන අවසාන ලකුණ අදියර දෙකෙහිම ලකුණු මත රඳා පවතින බව සලකන්න.

ප්‍රායෝගික ඉගැන්වීම එක් එක් අදියරට නියමිත කාල සීමාව තුළ දී පමණක් ඔබ විසින් සම්පූර්ණ කිරීම අනිවාර්ය වේ. කවර හේතුවක් නිසා හෝ අදාළ කාල සීමාවෙන් පිටත එම අදියර සම්පූර්ණ කිරීමට ඉඩ දෙනු නොලැබේ. තවද ප්‍රායෝගික ඉගැන්වීමේ 2 වන අදියරට කැඳවනු ලබන්නේ ප්‍රායෝගික ඉගැන්වීමේ 1 අදියර සාර්ථක ලෙස අවසන් කරනු ලබන අය පමණක් බව ද සලකන්න.

ප්‍රායෝගික ඉගැන්වීමේ දෙවන අදියර සඳහා විශ්වවිද්‍යාල කථිකාචාර්යවරයෙකු/වරියක විසින් නියම කරනු ලබන පාසලකට ඔබව කැඳවනු ලැබේ. ඔහුගෙන්/ඇයගෙන් ලැබෙන උපදෙස් අනුව ඔබ එම පාසලේ කාලච්ඡේද දෙකක් ඉගැන්විය යුතු වේ. ඔබට නියමිත දිනයේ දී ඒ බව දැන් වූ විට ඒ සඳහා සූදානම් ව පැමිණ ඉගැන්වීම කළ යුතු ය.

### 6.6.2 ප්‍රායෝගික ඉගැන්වීම කල් දැමීම

යම් හේතුවක් නිසා ඔබ මෙම අධ්‍යයන වර්ෂයේ දී ප්‍රායෝගික ඉගැන්වීම සඳහා ඉදිරිපත් නොවීමට බලාපොරොත්තු වන්නේ නම් ප්‍රායෝගික ඉගැන්වීම (ESU4326) විෂයය සඳහා ලියාපදිංචි වීමෙන් වළකින්න. ඔබ එම විෂයය සඳහා ලියාපදිංචිය ලබා ගෙන යම් හෙයකින් මෙම අධ්‍යයන වර්ෂයේ දී ප්‍රායෝගික ඉගැන්වීම සම්පූර්ණ නොකරන්නේ නම් ඉදිරි අධ්‍යයන වර්ෂයක දී ඒ සඳහා නැවත

ලියාපදිංචි වී ප්‍රායෝගික ඉගැන්වීම සම්පූර්ණ කර ගැනීමට ඔබට සිදු වේ. එවිට ඔබ ප්‍රායෝගික ඉගැන්වීම සඳහා නැවත පෙනී සිටින ශිෂ්‍යයකු වශයෙන් සැළකේ.

යම් හේතුවක් නිසා ඔබ මෙම අධ්‍යයන වර්ෂයේ දී ප්‍රායෝගික ඉගැන්වීම සම්පූර්ණ නොකරන්නේ නම් හා ඔබ ඊට සහභාගි නොවන බව තීරණය කළේ නම් හෝ ඒ බව විශේෂ අවශ්‍යතා අධ්‍යාපන අධ්‍යයනාංශයේ ප්‍රායෝගික ඉගැන්වීම අංශයට හා ශිෂ්‍ය කටයුතු අංශයට ලියාපදිංචිය ලබා ගෙන මාසයක් ඇතුළත දැනුම් දෙන්න. තවද වැඩසටහන සඳහා ඊළඟ අධ්‍යයන වර්ෂයට සිසුන් ලියාපදිංචි කරන අවස්ථාවේ දී මෙම පාඨමාලාව සඳහා ලියාපදිංචිය ලබා ගෙන එම අධ්‍යයන වර්ෂය තුළ දී ප්‍රථම වර පෙනී සිටින ශිෂ්‍යයකු ලෙස ඔබේ ප්‍රායෝගික ඉගැන්වීම සම්පූර්ණ කරවා ගැනීමට ද කටයුතු කරන්න.

### 6.6.3 විස්තර පත්‍රිකාව

පාඨමාලාව සඳහා <u>ලියාපදිංචිය ලබා ගන්නා අවස්ථාවේ දී</u> ප්‍රායෝගික ඉගැන්වීමට අදාළ පත්‍රිකා පිටපත් දෙකක් නිසි අයුරු පුරවා විශේෂ අවශ්‍යතා අධ්‍යාපන

අධ්‍යයනාංශයේ ප්‍රායෝගික ඉගැන්වීම් සම්බන්ධ නිලධාරියාට භාර දිය යුතු වේ.

එක් එක් අදියර අවසානයේ දී ඔබ විසින් එම අදියර සම්පූර්ණ කර ඇති බවට ලිපියක් ඔබේ ප්‍රායෝගික ඉගැන්වීමේ එක් එක් අදියර අධීක්ෂණය කරන මහතා/මහත්මියගෙන් ලබා ගෙන ඒවා ඔබ වෙත තබා ගත යුතු ය. ප්‍රායෝගික ඉගැන්වීමට අදාළ පත්‍රිකා පිටපත් දෙකක් නිසි ලෙස සම්පූර්ණ කර භාර නොදුන් ගුරු සිසුන්ගේ ප්‍රායෝගික ඉගැන්වීම සඳහා අධීක්ෂකවරු පත් කිරීම සිදු නොවනු ඇත. එසේම යම් අධ්‍යයන වර්ෂයක දී ප්‍රායෝගික ඉගැන්වීම සඳහා ඔබ ලියාපදිංචි වූ විට ඒ බව ඔබේ වාර්තා පොතෙහි ද සටහන් වී තිබේ දැයි පරීක්ෂා කර බලන්න.

### 6.6.4 විෂයයන් තෝරා ගැනීම

සතියකට ඔබ ඉගැන්විය යුතු කාලච්ඡේද දහය එක් විෂයයකින් හෝ විෂයයන් දෙකකින් විය හැකි ය.

ඔබ එක් විෂයයක් උගන්වයි නම් වසර මට්ටම් දෙකක් තෝරා ගත යුතු යි. විෂයයන් දෙකක් උගන්වයි නම් එකම වසර මට්ටමක් තෝරා ගැනීමට අවසර දිය හැකිය.

### 6.6.5 පාඩම් සැලසුම් හා කාලසටහන්

පළමු වන අදියර සඳහා ඉගැන්වීමට නියමිත සති දහය තුළ සතියකට කාලච්ඡේද දහයක් බැගින් වන සේ ඔබ විසින් පාඩම් සැලසුම් අඛණ්ඩව ලිවිය යුතු ය. මෙම සැලසුම් සියල්ල මොනිටර් එක්සයිස් පොත්වල හෝ සී.ආර්. පොත්වල පමණක් ලිවිය යුතු ය. එක ශ්‍රේණියක එක් විෂයකට එක පොත බැගින් තබා ගත යුතු ය. පොතේ පිටු අංකනය කළ යුතු අතර පිටු ඉවත් කිරීම තහනම් ය. එය වංචනික ක්‍රියාවක් සේ සැළකේ. එක් එක් පොතෙහි පාඩම් සැලසුම් සඳහා පිළිවෙලින් වෙන වෙනම අංක යොදන්න. පාඩම් සැලසුම් අනුපිළිවෙල සඳහා පටුනක් පිළියෙල කරන්න.

ප්‍රායෝගික ඉගැන්වීමේ පළමු වන අදියර පැවැත්වෙන කාල සීමාව සහ ඔබට පවරා ඇති ප්‍රමුඛාචාර්යවරයා/ වරිය ගේ නම සහ ලිපිනය ඔබට පසුව දැනුම් දෙනු ඇත. එසේ ඔබට දැනුම් දුන් පසුව ඔබේ පන්ති කාල සටහනේ පිටපතක් (වේලාවන් යොදන ලද) සතියක් ඇතුළත නොපමාව ප්‍රමුඛාචාර්ය වරයා/වරිය වෙත ලියාපදිංචි තැපෑලෙන් යවන්න. ඔබ ප්‍රායෝගික ඉගැන්වීමේ පළමුවන අදියරෙහි නිරත වන කාලපේද එහි පැහැදිලිව ලකුණු කර දක්වන්න.

ප්‍රායෝගික ඉගැන්වීමේ නිරත විය යුතු කාලය තුළ ඔබ නිවාඩු ගන්නේ නම් එම දින පිළිබඳව ද කල්වේලා ඇතිව ප්‍රමුඛාචාර්යවරයාට/ වරියට දැන්විය යුතුය.

### 6.6.6 අධීක්ෂණ ස්වභාවය

ප්‍රායෝගික ඉගැන්වීමේ පළමු වන අදියර සඳහා වන සති දහයේ කාල සීමාව තුළ ප්‍රමුඛාචාර්ය වරයා/වරිය විසින් ඔබේ පාඩම් පහක් අධීක්ෂණය කරනු ඇත. ඔබ පාසලේ විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත ළමයකු නොමැතිවිටකදී මින් සති 2 ක් විශේෂ අවශ්‍යතා සහිත ළමයකු සමඟ වෙනත් පාසලකදී (පාඩම් 2 ක්) ඇගයීමට ප්‍රමුඛාචාර්යවරයා කටයුතු යොදනු ඇත. එම පාඩම් අධීක්ෂණය කළ බවට ඔහුගේ /ඇයගේ අත්සන ඔබ විසින් ලබා ගත යුතු වේ. පළමු වන අදියර සම්පූර්ණ වීම සඳහා පාඩම් 5ක ලකුණු අධ්‍යාපන අධ්‍යයනාංශය වෙත ලැබිය යුතු ය. පාඩම් 5ට වඩා අඩුවෙන් ඔබේ පාඩම් ඇගැයීම කර ඇත්නම් ඔබ ප්‍රායෝගික ඉගැන්වීමේ දෙවන අදියර සඳහා සුදුසුකම් ලබන්නේ නැත.

ප්‍රායෝගික ඉගැන්වීම ඇරඹීමට නියමිත දින සිට සති දෙකක් තුළ ඔබේ ප්‍රමුඛාචාර්ය වරයා/වරිය පාඩම් අධීක්ෂණය සඳහා නොපැමිණියේ නම් සති දෙකක්

අවසානයේ වහාම ඒ බව විවෘත විශ්වවිද්‍යාලයේ විශේෂ අවශ්‍යතා අධ්‍යාපන අධ්‍යයන අංශයේ අදාළ නිලධාරියා වෙත දන්වන්න.

### 6.6.7 ප්‍රායෝගික ඉගැන්වීමේ අවසාන ලකුණු ගණනය.

ප්‍රායෝගික ඉගැන්වීම සඳහා ඔබගේ අවසාන ලකුණු ගණනය කරනු ලබන්නේ, පහත පරිදි ය.

(i.) පළමු අදියරේ ලබා ගන්නා පාඩම් පහේ සාමාන්‍ය ලකුණුවලින් (අඛණ්ඩ ඇගැයීම ලෙස සළකා) 30%ක් ද,

(ii.) දෙවන අදියරේ ලකුණුවලින් (අවසාන විභාග ලකුණු ලෙස සළකා) 70% ක් ද ගෙන අවසාන ලකුණු ගණනය කරන බව සලකන්න.

**සැලකිය යුතුයි**

දැනට යම්කිසි ආයතනයක සේවය කරන අයදුම්කරුවන් පහත සඳහන් ලිපිය ලියාපදිංචි වීමේදී රැගෙන ආ යුතුය.

අ. ප්‍රායෝගික ඉගැන්වීම අදියර 1 සඳහා විවෘත විශ්වවිද්‍යාලය විසින් නියම කරනු ලබන සති 10 ක කාල සීමාව තුළ අයදුම්කරුට නිවාඩු

ලබා දිය හැකි බවට ආයතන ප්‍රධානියාගෙන් ලබාගත් ලිපියක්

**ඉහත කොන්දේසි අනුව කටයුතු කිරීම අපහසු වන අයදුම්කරුවන්ට මෙම වැඩසටහන සඳහා අයදුම් කිරීමෙන් වැළකී සිටින ලෙසට උපදෙස් දෙනු ලැබේ.**

ආ. තෝරා ගැනීමෙන් පසුව අවශ්‍ය වන ලිය කියවිලි පිළිබඳව වැඩිදුරටත් දැනුවත් කරනු ලැබේ.

**වැදගත්**

ප්‍රායෝගික ඉගැන්වීමේ පළමු අදියර සඳහා ඔබ විසින් ලියන ලද පාඩම් සැලසුම් ප්‍රමුඛාචාර්ය වරයාගේ /වරියගේ සටහන් සහ අත්සන් සහිතව <u>දෙවන අදියරේ දී කථිකාචාර්යවරයා/ වරිය වෙත ඉදිරිපත් කළ යුතු වේ.</u> එවිට පාඩම් සැලසුම් සඳහා වෙන් කර ඇති ලකුණු කථිකාචාර්යවරයා /වරිය විසින් ඔබට ලබා දෙනු ඇත. එම අවස්ථාවේ දී පාඩම් සටහන් ඉදිරිපත් නොකළහොත් ඒ සඳහා ලැබෙන ලකුණු ඔබට අහිමි වනු ඇත.

ප්‍රායෝගික ඉගැන්වීමේ දෙවන අදියර අවසන් වීමෙන් පසු පළමු වන අදියර සඳහා ලියන ලද පාඩම් සැලසුම්, ඔබ වෙතම තබා ගන්න. අවශ්‍ය වුවහොත් ඒවා ගෙනවුත් අධ්‍යාපන

අධ්‍යයනාංශයට භාර දීමට පසුව දැනුම් දෙනු ඇත. නියමිත දින ප්‍රායෝගික ඉගැන්වීම සඳහා සහභාගි නොවුයේ නම් ඔබ අදාළ පරීක්ෂණය සඳහා නොපැමිණි අයෙකු ලෙස සැළකේ.

## 7.0 සහතික ප්‍රදානය

ශිෂ්‍යයෙකුගේ සාමාර්ථය තීරණය කිරීමේ දී පැවරුම්, ප්‍රායෝගික පුහුණුව හා අවසාන ලිඛිත පරීක්ෂණවලින් ලැබූ ලකුණු සැලකිල්ලට ගනු ලැබේ. උපාධි පරීක්ෂණයේ සාමාර්ථය මට්ටම් හතරකින් ප්‍රදානය කරනු ලැබේ. එනම් පළමු පෙළ ගෞරව සාමාර්ථ, දෙවන පෙළ ඉහළ සාමාර්ථ, දෙවන පෙළ පහළ සාමාර්ථ සහ සාමාන්‍ය සාමාර්ථ වශයෙනි. ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණය සඳහා තමාට ලැබෙන පළමු අවස්ථාවේ දීම පරීක්ෂණයට පෙනී නොසිටින අයදුම්කරුවෙකු පළමු පෙළ ගෞරව සාමාර්ථයක් සඳහා සලකා බලනු නොලැබේ.

ප්‍රායෝගික ඉගැන්වීමට ‘C’ සාමාර්ථයකට වඩා ඉහළ සාමාර්ථයක් ප්‍රදානය කරනු ලබන්නේ ප්‍රායෝගික ඉගැන්වීම සඳහා ප්‍රථම වරට ලියාපදිංචි වූ වර්ෂයේ දීම එය සම්පූර්ණ කරන්නේ නම් පමණි. ඊට පසු වර්ෂයක දී එය සම්පූර්ණ කරන්නේ නම් ප්‍රදානය කරනු ලබන්නේ උපරිම වශයෙන් ‘C’ සාමාර්ථයකි. අධ්‍යාපනවේදී අධ්‍යාපන උපාධි සම්මාන සාමාර්ථයක්

හෝ විශිෂ්ඨ සාමාර්ථයක් ලබා ගැනීමට නම් අනෙකුත් අවශ්‍යතා සම්පූර්ණ කරන අතරම ප්‍රායෝගික ඉගැන්වීම සඳහා අවම වශයෙන් 'B+' සාමාර්ථයක් ලබා ගැනීම අත්‍යවශ්‍ය බව ද සළකන්න.

විවෘත විශ්වවිද්‍යාලයේ විධිවිධානවලට අනුකූලව අධ්‍යාපනවේදී විශේෂ අවශ්‍යතා අධ්‍යාපන උපාධිය ප්‍රදානය කරනු ලැබේ.

## 8.0 පස්වන මට්ටම සඳහා ගාස්තු

| | | |
|---|---|---|
| ලියාපදිංචි කිරීමේ ගාස්තු | රු. | 400.00 |
| පහසුකම් ගාස්තු | රු. | 1500.00 |
| පුස්තකාල ගාස්තු | රු. | 100.00 |
| ශිෂ්‍ය උපදේශන ගාස්තු | රු. | 41580.00 |
| වැඩසටහන සඳහා සම්පූර්ණ ගාස්තුව | රු. | 43580.00 |

ශිෂ්‍යයින් විසින් අදාළ ගෙවීම් වාරික දෙකකින් සිදු කළ හැකිය. ලියාපදිංචි වීමේ දී සම්පූර්ණ ගාස්තුවෙන් 60% ක් ගෙවිය හැකි අතර ඉතිරි 40% අධ්‍යයන වැඩසටහන අතරතුර දී ගෙවිය හැකිය. විභාග අසමත් වන ශිෂ්‍යයින්ට නැවත ලියාපදිංචි වීමේ දී නැවත අධ්‍යයනය කිරීමට සිදු වන පාඨමාලා අනුව ගාස්තු ගෙවීමට සිදුවනු ඇත.

## 9.0 වැඩසටහනට අදාළ විමසීම්

මෙම වැඩසටහන සම්බන්ධ කිසියම් විමසීමක් හෝ යම් ලියවිල්ලක් එවන විට, යොමු කිරීම පහත සඳහන් පරිදි විය යුතු ය.

| | |
|---|---|
| අධ්‍යාපනික හා ගුරු පුහුණුව සම්බන්ධ ගැටලු | අධ්‍යයනාංශ ප්‍රධාන<br>විශේෂ අවශ්‍යතා අධ්‍යාපන අධ්‍යයනාංශය,<br>අධ්‍යාපන පීඨය,<br>ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය,<br>නාවල, නුගේගොඩ. |
| ලියාපදිංචිය සම්බන්ධව | ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී,<br>ශිෂ්‍ය කටයුතු අංශය,<br>ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය,<br>නාවල, නුගේගොඩ. |
| විභාග සම්බන්ධව | ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී,<br>විභාග අංශය,<br>ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය,<br>නාවල, නුගේගොඩ. |

## 10.0 අධ්‍යයන වැඩසටහන/පාඨමාලා කල් දැමීම

ලියාපදිංචි වී ඇති සම්පූර්ණ අධ්‍යයන වැඩසටහන කල් දැමීමට අවසර දෙනු නොලැබේ. පාඨමාලා කල් දැමීමට අදහස් කරන අයදුම්කරුවන් ශාස්ත්‍රීය අගය 9 ක් වන පාඨමාලා සඳහා ලියාපදිංචිය අනිවාර්යයෙන්ම රඳවා ගත යුතු ය. පාඨමාලා කල් දැමිය හැකි කාල සීමාව වැඩසටහන ආරම්භ වී මාස 1 1/2 කින් අවසන් වේ. කුමන හේතුවක් නිසා හෝ මෙම දිනය දීර්ඝ කරනු නොලැබේ. නැවත ලියාපදංචි වීමේ දී පළමු අවස්ථාවට වඩා වැඩි ගාස්තුවක් ගෙවීමට සිදු වනු ඇත.

## 10.1 ලියාපදිංචි වු අධ්‍යයන වැඩසටහනින් ඉවත් වීම

වැඩසටහනට ලියාපදිංචි වීමෙන් පසුව මසක් ඉකුත් වීමට පෙර 10% ක ගාස්තුවකට යටත්ව ලියාපදිංචි වූ අධ්‍යයන වැඩසටහනින් ඉවත් විය හැක. කුමන හේතුවක් නිසා හෝ මෙම දිනය දීර්ඝ කරනු නොලැබේ. විශ්වවිද්‍යාලය විසින් ලියාපදිංචි වීම/නැවත ලියාපදිංචි වීම සඳහා පැමිණිය යුතු බවට දන්වා එවන දිනයන්ට පසුව ලියාපදිංචි වීමේ කටයුතු කරනු නොලැබේ.

## 11.0 ලිපිනයන් වෙනස් වීම

ඔබේ රාජකාරි හෝ පෞද්ගලික ලිපිනය වෙනස් කිරීමට අවශ්‍ය නම් විවෘත විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය කටයුතු අංශයට පහත ලේඛන ඉදිරිපත් කරන්න. එම ලිපිවල පිටපත් අධ්‍යාපන අධ්‍යයනාංශයට ද ලැබෙන්නට සලස්වන්න.

1. රාජකාරි ලිපිනය වෙනස් කිරීම සඳහා නම් ආයතන ප්‍රධානියාගෙන් ලිපියක් සමග විස්තර
2. පෞද්ගලික ලිපිනය වෙනස් කිරීම සඳහා අදාළ ග්‍රාම සේවා නිලධාරියාගේ සහතිකය සමග විස්තර

ඉහත තොරතුරු අනුව කටයුතු කරමින් ඔබ විසින් අධ්‍යාපනවේදී අධ්‍යාපන උපාධි වැඩසටහන සාර්ථකව නිම කරනු ඇතැයි යන්න අපගේ අපේක්ෂාවයි.

## 12.0 අධ්‍යයන වැඩසටහනෙහි ආරම්භය

අධ්‍යාපනවේදී විශේෂ අවශ්‍යතා අධ්‍යාපන උපාධි වැඩසටහන 2016 සැප්තැම්බර් මස ආරම්භ කිරීමට නියමිතය.

## 13.0 වැඩසටහන හා සම්බන්ධව කටයුතු කරන අධ්‍යයන කාර්ය මණ්ඩලය

මෙම වැඩසටහනෙහි අධ්‍යයන කටයුතු සම්බන්ධ වගකීම් පැවරී ඇත්තේ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ, විශේෂ අවශ්‍යතා අධ්‍යාපන අධ්‍යයනාංශයටය. අධ්‍යයනාංශයේ ආචාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු මෙහි පහතින් ඉදිරිපත් කෙරේ. එමඟින් ඔබට පැන නගින විවිධ ගැටලු යොමු කළ යුතු වන්නේ කවුරුන් වෙත දැයි අවබෝධ කර ගැනීමට පහසු වනු ඇත.

**වැඩසටහනට සම්බන්ධ කාර්ය මණ්ඩලය**

| | |
|---|---|
| පීඨාධිපති | මහාචාර්ය පී.සී.පී ජවුෆර් මයා |
| අධ්‍යයනාංශ ප්‍රධාන | ආචාර්ය ටී.ඩී.ටී.එල් ධනපාල මයා |
| සම්බන්ධීකරණ නිලධාරී | බී.පී.එච්. අනුරුද්ධිකා මිය |
| ප්‍රායෝගික ඉගැන්වීම් කටයුතු සම්බන්ධ ප්‍රධාන කථිකාචාර්ය සහ කථිකාචාරිනි | බී.පී.එච්. අනුරුද්ධිකා මිය |
| පාඨමාලා සම්බන්ධීකරණය | |
| විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ මනෝ විද්‍යාව | බී.පී.එච්. අනුරුද්ධිකා මිය |

| | |
|---|---|
| විශේෂ අවශ්‍යතා අධ්‍යාපනයේ දාර්ශනික පදනම | ආචාර්ය ටී.ඩී.ටී.එල් ධනපාල මයා |
| විශේෂ අවශ්‍යතා අධ්‍යාපනයේ සමාජ විද්‍යාත්මක පදනම | බී.පී.එච්. අනුරුද්ධිකා මිය |
| විශේෂ තත්ත්වයන් සහ ඉගෙනුම් අවශ්‍යතා පිළිබඳ හැඳින්වීම | ආචාර්ය කේ. ඒ. සී. අල්විස් මිය |
| අධ්‍යාපනයේ නව ප්‍රවණතා | ආචාර්ය ටී.ඩී.ටී.එල් ධනපාල මයා |
| තුලනාත්මක අධ්‍යාපනය සහ අධ්‍යාපනික ගැටළු | බී.පී.එච්. අනුරුද්ධිකා මිය |
| අධ්‍යාපනික මාර්ගෝපදේශනය හා උපදේශනය | බී.පී.එච්. අනුරුද්ධිකා මිය |
| අන්තර්කරණ අධ්‍යාපනය | බී.පී.එච්. අනුරුද්ධිකා මිය |
| විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය තුළ මිනුම් සහ ඇගයුම | බී.පී.එච්. අනුරුද්ධිකා මිය |
| විෂයමාලා න්‍යාය හා පරිචය | ආචාර්ය කේ. ඒ. සී. අල්විස් මිය |

| | |
|---|---|
| විශේෂ අවශ්‍යතා සහිත ළමයින් සඳහා මනා පන්තිකාමර පරිසරයක් නිර්මාණය කිරීම | ආචාර්ය ටී.ඩී.ටී.එල් ධනපාල මයා |
| අන්තර්කරණ පන්තිකාමර වල ළමයින්ගේ ගැටළු සමග කටයුතු කිරීම | ආචාර්ය ටී.ඩී.ටී.එල් ධනපාල මයා |
| විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය සඳහා අධ්‍යාපන තාක්ෂණය | ආචාර්ය කේ. ඒ. සී. අල්විස් මිය |
| ප්‍රාථමික අධ්‍යාපනය | බී.පී.එච්. අනුරුද්ධිකා මිය |
| ප්‍රායෝගික ඉගැන්වීම | බී.පී.එච්. අනුරුද්ධිකා මිය |
| ව්‍යාපෘතිය | ආචාර්ය කේ. ඒ. සී. අල්විස් මිය |
| ළමා අයිතිවාසිකම් | බී.පී.එච්. අනුරුද්ධිකා මිය |
| අධ්‍යාපනික කළමාණාකරණය | බී.පී.එච්. අනුරුද්ධිකා මිය |
| පුනරුත්ථාපනය හා ප්‍රජා මුලික පුනරුත්ථාපනය | ආචාර්ය ටී.ඩී.ටී.එල් ධනපාල මයා |

## 14.0 My OUSL

ඔබට දැන් විවෘත විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන් වෙනුවෙන් ඇති My OUSL පහසුකම වෙත පහත සඳහන්

URL:http://myousl.ou.ac.lk/

ලිපිනය භාවිත කර පිවිසිය හැක. එමෙන්ම

http://www.ou.ac.lk/

මගින් විවෘත විශ්වවිද්‍යාලයේ වෙබ් පිටුව තුළින් ද එයට පිවිසිය හැක. ඒ සඳහා ඔබගේ ශිෂ්‍ය වාර්තා පොතේ පුද්ගලික තොරතුරු පිටුවේ සඳහන් පරිදි

User Name: [Student ID]

Password : [National ID number]

වශයෙන් භාවිත කරන්න.

පළමු පිවිසුමේදීම ඔබගේ තොරතුරු ආරක්ෂා කර ගැනීම සඳහා Password වෙනස් කර ගැනීමට අමතක නොකරන්න.

## 15.0 අයදුම්පත් සහ ලියාපදිංචිය

අධ්‍යාපන පීඨය මගින් පිරිනමනු ලබන මෙම උපාධි වැඩසටහනට online ආකාරයට අයදුම් කළ යුතුය.ඇමුණුම අංක 1 දී ඇති උපදෙස් වලට අනුකූලව එම online අයදුම්පත පිරවීමට සැලකිලිමත් වන්න.

## 15.1 ලියාපදිංචි වන ආකාරය

ලියාපදිංචිය සඳහා තෝරාගන්නා ලද අයදුම්කරුවන්ට එය පෞද්ගලිකව දන්වනු ලැබේ.එවිට අදාළ දිනයෙහි ලියාපදිංචිය සඳහා ඔබ පැමිණිය යුතුය.ලියාපදිංචිය සිදුකරන්නේ කොළඹ ප්‍රාදේශිය මධ්‍යස්ථානයේදී පමණි.

**ලියාපදිංචිය සඳහා අවශ්‍ය ලියකියවිලි**

1- ජාතික හැඳුනුම්පත සහ එහි ජායා පිටපතක්
2- උප්පැන්න සහතිකය සහ එහි ජායා පිටපතක්
3- Passport ප්‍රමාණයේ ජායාරූප 03(මිමි35 x මිමි45)
4- **ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ ඕනෑම ඩිප්ලෝමා මට්ටමේ පාඨමාලාවකට අදාළ සවිස්තරාත්මක ප්‍රතිඵල සටහන සහ සහතිකය**
5- ගෙවන ලද වව්චර් පතේ විශ්ව විද්‍යාල පිටපත
6- ඉගැන්වීම් පුහුණුව (ESU4326) සඳහා සති 10 නිවාඩුවක් දෙන බව සඳහන් සේවායෝජකයාගෙන් ලබාගත් ලිපිය
(මෙය අදාළ වන්නේ ගුරුවරුන් නොවන සේවා දායකයන්ටය)

## 16.0 වැදගත් දින

ලියාපදිංචිය/නැවත ලියාපදිංචිය - 23.08.2016
පසු ලියාපදිංචිය - 27.08.2016
අධ්‍යයන කටයුතු ආරම්භය - 2016 සැප්තැම්බර් මස සිට

# ඇමුණුම 1

## Online අයදුම්පත් සඳහා උපදෙස්

2016/2017 උපාධි වැඩසටහන් සඳහා අයදුම්පත් භාර දිය හැක්කේ Online ආකාරයටය. පළමුව ඔබ කළ යුත්තේ Online වලට ප්‍රවේශවීම සඳහා Online Login Account එකක් නිර්මාණය කර ගැනීමයි. ඔබගේ අයදුම් පත්‍රය Online ආකාරයට භාර දීම සම්බන්ධව ඉදිරි වැඩකටයුතු කළ හැක්කේ ඉන් අනතුරුවය.

1. අන්තර්ජාලය තුල www.ou.ac.lk ලෙස type කරන්න.

2. Online Login Account එකක් ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ ප්‍රධාන වෙබ් පිටුවේ ඇති 'online application' මත click කරන්න.

   අළුත් account එකක් නිර්මාණය කර ගනිමින් එක වර ලියාපදිංචිය ලබා ගන්න. මෙය කිරීම සඳහා ලබා දී ඇති උපදෙස් වලට අනුකූලව 'create new account' මත click කරන්න.

   **<u>සැලකිය යුතුය</u>**

   අවශ්‍යයෙන්ම සම්පූර්ණ කල යුතුය යැයි පෙන්වා දී ඇති තැන්වල ඔබගේ හෝ පවුලේ සාමාජිකයෙකු හෝ මිත්‍රයෙකුගේ ලිපිනය සහ ජංගම දුරකථන අංකය සඳහන් කිරීමට සැලකිලිමත් වන්න.

ඔබගේ අයදුම්පත්‍රයෙහි රිසිට් පත පිළිබඳව දැනුම් දීම සඳහා අවශ්‍ය වු විට අමතර තොරතුරු ලබා දීම සඳහා විශ්වවිද්‍යාලය මින් ඉදිරියට භාවිත කරනු ලබන්නේ එම විද්‍යුත් තැපැල් ලිපිනය සහ ජංගම දුරකථනයයි.

3. ඔබගේ online account එක නිර්මාණය කර ගත් පසු ඔබගේ අයදුම්පත්‍ර භාර දීම සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු කළ හැක. මේ සඳහා 'online application' වෙත ගොස් ඔබගේ user name සහ password type කරන්න. අනතුරුව online application form එක පුරවන්න. එය පුරවා අවසානයේ submit කරන්න.

<u>**සැලකිය යුතුය**</u>

ඔබ ගෙවීම් කරන ක්‍රමය තෝරාගෙන ලබා දී ඇති උපදෙස් අනුව ඊට අදාළ තොරතුරු පුරවන්න. අයදුම්පත්‍ර සඳහා අයකරනු ලබන්නේ රු.350 පමණි. මෙය ඔබට ඔබගේ credit හෝ debit card මගින් ගෙවිය හැකිය. credit සහ debit card නොමැති අයදුම්කරුවන්ට අදාළ ගෙවීම් මුදල් වලින් ඕනෑම ප්‍රාදේශීය හෝ අධ්‍යයන මධ්‍යස්ථාන මගින් කළ හැක.

online applitcation එක පිරවීම සඳහා සහයක් අවශ්‍ය අයදුම්කරුවන්ට ඕනෑම ප්‍රාදේශීය හෝ අධ්‍යයන මධ්‍යස්ථානයක් මගින් අවශ්‍ය සහය ලබා ගත හැක. ඒ සඳහා පහත තොරතුරු ලබා දිය යුතුය. අයදුම්කරුගේ සම්පූර්ණ නම සහ ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය ලිපිනය ජංගම දුරකථන අංකය අ.පො.ස (උ.පෙළ) ප්‍රතිඵල සටහන.

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ අදාල ප්‍රාදේශීය සහ අධ්‍යයන මධ්‍යස්ථාන වල විස්තර ඇමුණුම – 2 දක්වා ඇත.

Appendix - 1

## Sample Online Application form



# Online Application

### Please fill the Application

**Personal Details**

Title: Mr.
Initial
LastName
Name Denoted by Initials
Address line 1
Address line 2
Address line 3
NIC/Passport No
Date of Birth
E mail
Telephone -Mobile
Telephone -Fixed
Country: Sri Lanka

**Programe Details**

Programe: Please select
Prefferd Center: Please select
Programme Medium: Please select
Selection Test Medium: Please select

Appl Now | Reset

# Appendix - 2

## Contact Details - OUSL Regional/Study Centres

| **Centre** | **Centre Code** | **Postal Address** | **Contact No.** |
|---|---|---|---|
| **Regional Centres** | | | |
| Colombo | WP10 | OURC, Nawala, Nugegoda. | 011-2853930 |
| Kandy | CP20 | OURC, Polgolla, Kandy. | 081-2494083/ 084/495/ 496/ 497 |
| Matara | SP30 | OURC, Nupe, Matara. | 041-2222943/ 041-2229782 |
| Batticaloa | EP60 | OURC, No.23, New Road, Batticaloa. | 065-2222264 |
| Jaffna | NP40 | OURC, Browns Road, Kokuvil, Jaffna. | 021-2223374 |
| Anuradhapura | NC50 | OURC, Jayanthi Mawatha, (Depot Area), Anuradhapura. | 025-2222871 |
| Badulla | UP80 | OURC, No. 179, Keppitipola Rd., Badulla. | 055-3012151/ 055-2228842 |
| Kurunegala | NW70 | Negombo Rd., Malkaduwawa, Kurunegala. | 037- 2223473 |
| **Study Centers** | | | |
| Ambalangoda | SP31 | 80/1, Polwatte Road, Halwatura Ambalangoda. | 091-2258585 |
| Ambalanthota | SP33 | Rajasaranagama Road, Lunama South, Ambalanthota. | 047-2225533 |
| Ampara | EP61 | Inginiyagala Road, Samapura, Ampara. | 063-2222052 |

| | | | |
|---|---|---|---|
| Bandarawela | UP81 | St .Thomas Road, Wewatenna, Bandarawela. | 057-2222820 |
| Galle | SP32 | Labuduwa, Galle. | 091-2223784 |
| Gampaha | WP11 | Gampaha road, Miriswatte, Mudungoda. | 033-2234571/ 033-2234572 |
| Hatton | CP21 | Thondaman Vocational Training Centre, Hatton. | 051-2225139 |
| Kalutara | WP12 | 66/2, Nagoda Road, Kaluthara. | 034-2223399 |
| Kegalle | SG91 | Kumaratunge Munidasa Mawatha, Kegalle. | 035-2222501 |